# හොඳ සිංහල 2

## වී ක ධර්මබන්ධු

සිංහල භාෂාවේ නාම පදවල උක්ත (රූප) අනුක්ත (රූප) භේදයක් දක්නට ලැබේ. ඒ අනුව ඒවා

1. ප්‍රාණවාචී අභියම් අර්ථ ඒක වචන නාම පද
2. ප්‍රාණවාචී බහු වචන නාම පද
3. අ. ප්‍රාණවාචී සර්වනාම පද
3. ආ. ප්‍රාණවාචී නිෂ්ඨිති රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද

යනුවෙන් සතර වර්ගයකට බෙදෙන බව පෙනේ.

**1. ප්‍රාණවාචී අභියම් අර්ථ ඒක වචන නාම පද**

උක්ත රූප :- වඳුරෙක්, යකෙක්, වැඳිරියක්, යැකින්නක් අනුක්ත රූප :- වඳුරකු, යකකු, වැඳිරියක, යැකින්නක

භාෂාවක නාම පද නියම් සහ අභියම් යනුවෙන් දෙ ගණයකට බෙදේ. ඒක වචනයේ දී පමණක් ඒ සඳහා වෙන ම විභක්ති ප්‍රත්‍යය එක් වී ව්‍යවහාර වේ.
වඳුරෙක්/වැඳිරියක් අඹ ගසේ සිටී යන වැකියේන් වඳුරා/වැඳිරිය අඹ ගසේ සිටී යන වැකියේත් අදහස එකක් නො වේ. මුල් වැකියේ ඇත්තේ අප කලින් කිසි දාක දැක නැති ආගන්තුක වඳුරෙකි/වැඳිරියකි. ඉය/ඇඅ ගැන කිසිවක් නො දනිමු. එය 'අභියම්' නාම පදයකි. එහෙත් දෙ වැනි වැකියේ ඇත්තේ අප කලින් දැන සිටි, හිතර අප හිවසට පැමිණෙන වඳුරෙකි/වැඳිරියකි. ඉය/ඇ ගැන බොහෝ දේ අපි දනිමු. එය 'නියම්' නාම පදයකි.
නියම් අභියම් භේදය දක්නට ලැබෙන්නේ ඒක වචනයේ දී පමණි.

වඳුරෙක්/වැඳිරියක් අඹ ගසේ සිටී.
අපි රියේ සත්තකයන් දී සුදු වඳුරකු/වැඳිරියක දුටුමු.
මල්ලි රියේ වඳුරකුට/වැඳිරියකට ගලකින් ගැසී ය.
පිස්සෙක් වඳුරකුගෙන්/වැඳිරියකගෙන් හාදු ගනී.

යන වැකි එයට නිදසුන් ය. 'වඳුරො වගයක් අඹ ගහට ඇවිත්' යන වැකියේ 'වඳුරො වගයක්' යනු අභියම් අර්ථ බහු වචන අර්ථ දෙන තැනකි. ඒ ව්‍යවහාරය දොඩන බසේ මිස ලියන බසේ දක්නට හො ලැබේ. ලියන බසේ දී 'අභියම් අර්ථ' බහු වචන පද හඳා ගන්නා සැටි 'ප්‍රාණවාචී බහුවචන නාම පද' ගැන උගන්නා විට උගනිමු.

**2. ප්‍රාණවාචී බහු වචන නාම පද:**

උක්ත රූප : වඳුරෝ, යක්කු - වැඳිරියෝ, යැකින්නෝ
අනුක්ත රූප : වඳුරන්, යකුන් - වැඳිරියන්, යැකින්නන්

මේ බහුවචන නාම පදවල නියම් අභියම් භේදයක් දක්නට හො ලැබේ. දොඩන බසේ දී උක්ත රූපයට ම 'වගයක්' යන 'ඔහු' යන්න උක්තය සඳහා යෙදුණු විට බහු වචන අර්ථ ගත්තා වූත්, අනුක්තය සඳහා යෙදුණු විට ඒක වචන ගත්තා වූත් පදයකි. එහෙත් අද එය ඒක වචන උක්තය වශයෙන් ද බොහෝ දෙනා භාවිතා කරති.
එ සේ ම 'ඇඅ' යන ඒක වචන අනුක්ත රූපය. දැන් උක්තය වශයෙන් ද භාවිතා වනු පෙනේ. එහි උක්ත රූපය 'ඕ' බව වත් ඔහු නො දනිති.

පදය එක් කොට වඳුරො වගයක්, බල්ලො වගයක්, වැඳිරියො වගයක් බැල්ලො (බැල්ලියො) වගයක්' යනුවෙන් අභියම් අර්ථ පද සඳා ගන්නා බව පෙනේ.

* වඳුරෝ/වැඳිරියෝ අඹ ගසේ සිටිති.
* අපි රියේ සත්තකයේ (සත් උයන) දී සුදු වඳුරන්/වැඳිරියන් දුටුමු.
* මල්ලි රියේ වඳුරන්ට/වැඳිරියන්ට (ගල්වලින්) ගලින් ගැසී ය.
* වඳුරන්ගෙන් වැඳිරියන්ගෙන් අපේ හේනට හානි සිදු වේ.

ආදි වශයෙන් එම බහු වචන පද වාක්‍යවල යෙදෙන්නේ (අභියම් අර්ථ බහු වචනය ම යෙදිය යුතු වූ විට (විභක්ති ප්‍රත්‍යය ඉවත් කොට) ශබ්ද ප්‍රකෘතියට සමූහ අර්ථ පදයක් එක් කොට ව්‍යවහාර කළ හැකි ය. එවිට එය සමාස පදයක් වේ.
වඳුරු රංචුවක් / රූනක් / රැළක් / මුළක් / හැත්තක් යනු එසේ සඳා ගත් පද කිහයකි. එහැන උක්ත වන්නේ සමූහාර්ථ පදයක්, ප්‍රාණවාචී බහුවචන පදය නො වේ.)

**3. අ. ප්‍රාණවාචී සර්වනාම පද:**

උක්ත රූප: හේ/ඔහු, ඕ/ඇඅ, ඔහු/ඔවුහු
තෝ, ඔබ, තොපි/තොපි, මම, අපි
අනුක්ත රූප : ඔහු ඇඅ, ඔවුන්, තා, ඔබ, තොප, මා, අප

* හේ/ඔහු, ඕ/ඇඅ පොතක් බලයි
* මම පොතක් බලමින් සිටි ඔහු - ඇඅ දිටිමි.
* ඔහු/ඔවුහු අඹ කරති.
* මම අඹ කඩමින් සිටි ඔවුන් දිටිමි.
* තෝ, නුඹ බොරු, කියහි/කියයි.
* මම පොතක් බලමින් සිටි තා, ඔබ, නුඹ දිටිමි.
* තොපි/තොපි, ඔබ, නුඹලා බොරු කියතු/කියති.
* මම අඹ කඩමින් සිටි තොප, ඔබ, නුඹලා දිටිමි.

**සිංහල ලියන්න ගන්නට කැමති සැමට විමසුමි**

* මම පොත බලමි. * අපි පොත් බලමු.
* ගුරුතුමා මා කැඳවයි. * ගුරුතුමා අප කැඳවයි.

'ඔහු' යන්න උක්තය සඳහා යෙදුණු විට බහු වචන අර්ථ ගත්තා වූත්, අනුක්තය සඳහා යෙදුණු විට ඒක වචන ගත්තා වූත් පදයකි. එහෙත් අද එය එක් වචන උක්තය වශයෙන් ද බොහෝ දෙනා භාවිතා කරති.
එ සේ ම 'ඇඅ' යන ඒක වචන අනුක්ත රූපය. දැන් උක්තය වශයෙන් ද භාවිතා වනු පෙනේ. එහි උක්ත රූපය 'ඕ' බව වත් ඔහු නො දනිති.

ඉංග්‍රීසියේ 'ශදළ' මෙන් අපේ 'ඔබ' ඒක වචන/බහු වචන, උක්ත රූපය/අනුක්ත රූපය, ස්ත්‍රී ලිංග / පුරුෂ ලිංග යන හැම තැනට ම යෙදිය හැකි පදයකි.

'දරුවා - දැරිය, ඔබ බොරු (කියහි/කියයි) කියතු/කියති. දරුවනි - දැරිය, ඔබ බොරු (හැම දෙනා) බොරු කියතු / කියති.
මම ඔබ අඹ කඩනු දිටිමි.
ඔබ තිදෙන විහාරයෙන් සමත් වනු හියති.
මම ඔබට (ඔබ තිදෙනාට) රහසක් කියමි.
මම ඔබෙන් (ඔබ තිදෙනාගෙන්) උදව්වක් ඉල්ලමි.

'ඔබ' යන්න උක්ත වූ විට බහු වචන ආඛ්‍යාතයක් ම යෙදීම පිළිගත් රීතියයි. ඒ අනුව 'ඔබ බොරු කියයි' යනු සඳොස් ය. 'ඔබ බොරු කියති' යන්න නිදොස් ය.

'ඔහු' යන බහු වචන උක්තය අනුව 'ඔවිත්' යන අනුක්ත පදය, සැදී ඇත. යළි කථිරුන් හෝ 'ඔවිත්' යන පදය අනුවද ඔවිහු' යනුවෙන් උක්ත රූපයක් හදාගෙන භාවිතා කළ හැක බව පෙනේ. ඒ අනුව 'ඔහු' යන හිවරදිළ රූපය යටපත් වී 'ඔවිහු' යන, කියවීමට ද අමාරු සඳොස් ව්‍යවහාරය ආරම්භ වී ඇත. කවර බසක වුව ද මේ බඳු 'පිළි පැන ගිය' තැන් දක්නට ලැබේ.

'මේ බඳු මේ ගුළි තුන - තොපි යව ඇදුර ඇර ගෙන' යන තුරු හියන් ගේ යෙදුම බලා ගෝළයන් ද 'ඇදුර තොපි යව' යන ව්‍යවහාරය බිහොත් ලෙස සලකන්නට බැරි නැත. මෙතැන 'තොපි' යන බහු වචන රූපය පොදා ඇත්තේ තෝ/ඔබ වෙනුවට ය. කාව්‍ය කරණයේ දී ඒරිත එළිවැව රැකීම සඳහා කරන වරදිදු දුහුනන් (ව්සිනි) අනුගමනය නො කළ යුතු ය.
'ඔවිහු' යන්න ද ඒ සේ ඇති වූවක් දැක් නොදකිමි. ඔදීදුනු කියවීම අපහසු හිසා 'උ' ස්වරය ලොප් කොට 'ඔවිහු' යනුවෙන් භාවිතා කළ හැකි ය.

**3. ආ. ප්‍රාණවාචී සර්වනාම පද (සමූහ අර්ථ)%**

උක්ත රූප: ඇතැමුන්(ඇතැමුහු), සමහරුන්, කවිරුන්, ඇතැමෙක්, සමහරෙක්, කවරෙක්, යමෙක්, කිසිවෙක්, කෙනෙ-ක්, අයෙක්.
අනුක්ත රූප: ඇතැමුන්, සමහරුන්, කවිරුන්, ඇතැමකු, සමහරකු, කවරකු, යමකු, කිසිවකු, කෙනකු, අයකු

* ඇතැමුන්(ඇතැමුහු), සමහරුන්, ඇතැමෙක්, සමහරෙක්, කෙනෙක්, අයෙක් සුරා මතින් හටත්.
* සඳේ සා රුවක් ඇතැයි දැක් කවිරු කියද්ද? (කියත් ද?)
* සඳේ සා රුවක් ඇතැයි දැක් කවරෙක්, යමෙක, කිසිවෙක් කියා (කියයි) ද?

මේ පද තුන ඒක වචන ලෙස සැලකේ..... සක් සැපත් කවරෙක් පතා? (ගුත්තිල කාව්‍යය)

* ඇතැමුන්, සමහරන්, ඇතැමකු, සමහරකු, කෙනකු, අයකු සුරා මතින් බමුනු නො පෙනේ ද? යමකු, කිසිවකු
* සඳේ සා රුවක් ඇතැයි කවිරන්, කවරකු, කිවත් අද අපි එය නො දඤමු.

'කෙනෙක්' වැනසෙති ඇඹි උල්වල'
'හටත් අයෙක් සුරා මතින්'

යන නිදසුන් බලන්න. සමහර පළාත් වල සමහරුන් 'කෙනා' යනුවෙන් නියම් අරගත් ඇති පදයක් ව්‍යවහාර කරන බව දනිමි.

'එදා කඩේ හිටපු 'කෙනා/එක්කෙනා' අද හෑ'
'ඒක කියපු 'කෙනාගෙං' අහගනිං'
'ඒක කියපු 'කෙනාරා' මෙහෙ එන්න කියපං' වැකි කියමින් දොඩන බසට සීමා වී ඇත. සමහරු 'කෙනා' වෙනුවට 'එකා' යන පදය ද භාවිතා කරති. එහෙත් එය හොඳ - ශිෂ්ට ව්‍යවහාරයක් හො වේ.

## කෑමට පස්සු.....

ඇස්සඳකොරොස් ලියයි